# ශාක් ලුවී ඩේවිඩ් සිය සිතුවම් මගින් ප්‍රංශ මහා විප්ලවය සඳහා ලබා දුන් දායකත්වය

*ආර්. පී. සුපුනි හසින්ති [1]*
HU/2011/2294

පැරණි සම්භාව්‍ය ග්‍රීක රෝම කලාවේ ආභාසයෙන් සකස් කරනු ලැබූ නව සම්භාව්‍යවාදයේ පුරෝගාමියා බවට පත්වන්නේ ශාක් ලුවී ඩේවිඩ් ය. ප්‍රංශ රදළ සමාජයෙහි කිරුළු දරන ලද රොකෝකෝ කලාව පරදවා නැගී එන ප්‍රංශ මහා විප්ලවයේ මනෝභාවයන් එළි දැක්වීම සඳහා ක්‍රියාකාරී ලෙස සිතුවම්කරණයේ නියැලි ලුවී ඩේවිඩ් විප්ලවයේ සිත්තරා නමින් ප්‍රකට විය. ඔහු සිය සිතුවම් මගින් ප්‍රංශ මහා විප්ලවය සඳහා ලබා දුන් දායකත්වය කෙසේවීද යන්න අධ්‍යනය කිරීමේ දී මූලාශ්‍ර වශයෙන් පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල භාවිත කිරීම සිදු කෙරුණි. ප්‍රංශ විප්ලවය සිදු වූයේ ක්‍රි.ව. 1789 දී වුව ද ඊට වසර ගණනාවකට පෙර සිටම ඒ සඳහා අවශ්‍ය සමාජ සාධක සකස් වෙමින් පැවතිණි. ප්‍රංශය ඇතුළු සමස්ත යුරෝපයෙහිම සමාජ සංස්ථාවෙහි පමණක් නොව දර්ශනවාදය, කලාව ඇතුළු විවිධ අංශවල විප්ලවයේ පූර්ව සූදානම දැකගත හැකි විය. මෙසේ කලාවෙහි දී සිදුවූ විප්ලවීය සූදානම ලුවී ඩේවිඩ් ශිල්පියාගේ සිතුවම් නිරීක්ෂණය කරන කල ගම්‍ය වේ. විප්ලවය සඳහා ප්‍රංශ ජනතාව මානසිකව සූදානම් කිරීම වෙනුවෙන් සමකාලීන දාර්ශනිකයන් හා සාහිත්‍යකරුවන් සිදු කළ කාරය භාර්යයට සමාන කාර්යයක් ඩේවිඩ් චිත්‍ර කලාවෙන් සිදු කළේය. ඒ අනුව, ඉතිහාසය පුරා දක්නට ලැබෙන ආගමික කලාකරුවන් අතර ප්‍රථම වරට හමුවන දේශපාලනික කලාකරුවා ඩේවිඩ් විය. ඔහු විසින් නිර්මාණය කරන ලද හොරාතිගේ දිවුරුම, බෲටස්ගේ මළදරුවන් රැගෙන ඒම, සොක්‍රටීස්ගේ මරණය, මරාගේ මරණය වැනි සිතුවම් මගින් ඔහු ප්‍රංශ මහා විප්ලවය සඳහා පෙළ ගැසුනු ජනතාව මානසික වශයෙන් දිරිමත් කළ අයුරු පිළිබිඹු වේ. පෞද්ගලිකත්වය අභිබවා පොදු මතයට අනුව නිර්භීත ජනතාව ඉදිරියට යා යුතු බව මේ සිතුවම් මගින් අවධාරණය කර ඇත. පසළොස් වැනි ලුවී රජුගේ කාලයේ සිට ප්‍රංශයේ ප්‍රචලිතව පැවති වංශවතුන් පිනවීමේ කලාවක්වූ රොකෝකෝ කලාවේ මෙන් සැරසිලි, අලංකරණ බහුලත්වය නිරූපණය පසෙක ලා කාලීන අවශ්‍යතාවයකට අනුව කලාව මෙහෙයවූ ඔහුගේ සිතුවම් බහුතරයක වීරත්වය යන සංකල්පය ප්‍රබල ලෙස ගැබ් වී තිබෙනු දැක ගැනීමට හැකිවීම විශේෂ ලක්ෂණයකි. විප්ලවයකින් වැඩවසම් යුගය අවසන් කර නව සමාජයක් උදාකර ගැනීමෙහි ලා ජනතාව උත්තේජනය කළ අන්දම ඔහුගේ සිතුවම් මගින් දැක ගැනීමට හැකිවේ.

ප්‍රමුඛ පදඃ නව සම්භාව්‍යවාදය, ශාක් ලුවී ඩේවිඩ්, ප්‍රංශ මහා විප්ලවය, වීරත්වය

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) තෙවනවසර*